# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

## පෙරහුරු පරීක්ෂණය - 2025

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය : පැය 01 යි |
|---|---|---|


**සැලකිය යුතුයි:**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමිවේ.**
- **අමතර කියවීම් කාලය විනාඩි 20 කි.**

01. පහත සඳහන් කෘති අතරින් ඩිමුන්ඩෝ කෘතිය රචනා කර ඇති කතුවරයා කවුරුන්ද?

1. මෙගස්තිනිස් 2. ඇරිස්ටෝටල් 3. ප්ලීනි 4. ඔනෙසික්‍රිටස්

02. ඉසුරුමුණි විහාරයෙහි දක්නට ඇති ක්‍රි.ව. හත්වන සියවසේ නිර්මාණය කරන ලද මූර්තිය වන්නේ මින් කුමක්ද?

1. පුන්කලස හා ඇත් රූප
2. නාගරූප
3. ශිව පාර්වති මූර්තිය
4. අශ්වහිස සහ මිනිසා

03. පුර්ව ඓතිහාසික යුගයේ මැටි ඔරු ආකාරයේ සුසන දීර්ඝ කාලයක් තිස්සේ නොනැසී පැවතීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,

1. මැටි අච්චුවේ වියලා මෙම සුසාන නිර්මාණය කර තිබීම.
2. ගින්නට හසුවීම නිසා මැනවින් පිලිස්සී තිබීම.
3. අමු මැටි භාවිත කරමින් නිර්මාණය වී තිබීම.
4. පොළොවට ලම්බකාරව බිත්ති නිර්මාණය කර තිබීම.

04. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සංස්කෘතික අවධි දෙකක් ගැන සඳහන් වේ. ඉන් දෙවන අවධිය හැඳින්වීමට භාවිතාවන යෙදුම වන්නේ,

1. පුර්ව ඓතිහාසික යුගය ලෙස.
2. ගල් යුගය ලෙස.
3. ප්‍රාග් ඓතිහාසික යුගය ලෙස.
4. මුල් ඓතිහාසික යුගය ලෙස.

05. කණ්ඩායමක් නිවැරදි ආකාරයට හසුරුවා ගැනීම තුළින් නායකයෙකු බිහි කර ගැනීමේදී ඔහු තුල තිබිය යු වැදගත් ගුණාංගයක් වන්නේ මින් කුමක්ද?

1. ආදරය 2. කරුණාව 3. විශ්වාසය 4. පක්ෂපාතිත්වය

06. මෙරට දේශපාලන බලය විමධ්‍යගතව පැවති අවදියේ රාජ්‍ය ගොඩනැගී තිබුනේ මින් කුමන පුද්ගල ඒකාබද්ධ කර ගැනීමෙන්ද?

1. මහාසම්මතවරු 2. පරුමකවරු 3. රජවරු 4. ගම්කවරු

07. මැදිරිගිරියේ පිහිටා තිබූ ඇත්වෙහෙර නමින් හැඳින්වූ පධානඝරයට ඉඩම් පුජාවක් කිරීමේ නීතිමය කටයු සිදුව ඇත්තේ මින් කුමන රජතුමාගේ කාලයෙහිද?

1. දෙවන සේන රජු කාලයෙහි
2. හතරවන මහින්ද රජු කාලයෙහි
3. දෙවන ගජබාහු රජු කාලයෙහි
4. වළගම්බා රජු කාලයෙහි



CamScanner

08. පහතින් ශ්‍රී ලංකාවේ රජවරු සෙෞඛ්‍ය පහසුකම් නංවාලීමට කටුතු කළ ආකාරය පහත දැක්වේ. ඒ අනුව "අ" හා "ආ" තීරු ගැලපු විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. හතරවන කාශ්‍යප රජු | A - සොත්ථිශාලා ඉදිකිරීම |
| 2. පළමුවන උපතිස්ස රජු | B - පසවන්තිනාම සාලා ඉදිකිරීම |
| 3. පණ්ඩුකාභය රජු | C - උපසග්ගරෝගනාස රෝහල් ඉදිකිරීම |

1. BAC 2. CAB 3. CBA 4. BCA

09. පහත සඳහන් වන්නේ අතීතයේ ශ්‍රී ලංකාවට පැමිණි වෙළඳ සංවිධාන කිහිපයක් හා ඔවුන් පැමිණි ප්‍රදේශයි. ඒ අනුව "අ" හා "ආ" තීරු නිවැරදිව ගැලපුවිට ලැබෙන නිවරදි පිළිතුර මින් තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| වෙළඳ සංවිධානය | පැමිණි ප්‍රදේශය |
| 1. කාම්බෝජවරු | A - ග්‍රීක හා මැසිඩෝනියනන් |
| 2. නානාදෙසින් | B - මලය අර්ධද්වීපය |
| 3. අයෝනියන්වරු | C - ඇෆ්ගනිස්තානය |
| 4. ජාවකවරු | D - ඉන්දියාව |

1. DCBA 2. BCDA 3. ADBC 4. CDAB

- පහත තොරතුරු අධ්‍යනය කරන්න.

A - වැව බැම්ම සැතපුම හතක් වාපාකාර වීම.
B - පස් තට්ටු කීපයක් උපයෝගී කර ගැනීම.
C - කෘතිමව සාදන ලද බැම්මක් වීම.
D - වැව බැම්මේ උස අඩි 44 වීම.

10. ඉහත තොරතුරු ඇසුරින් යෝධ වැවේ වැව බැම්මේ දක්නට ලැබෙන ලක්ෂණ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. A හා B ය 2. B හා D ය 3. A, B හා D ය 4. A, C හා D ය

11. ක්‍රි.ව. පස්වන සියවසේ ඉදිකරන ලද විශිෂ්ට නාගරික මධ්‍යස්ථානයකට උදාහරණ වන්නේ මිණ කුමක්ද?

1. අනුරාධපුර නගරය 2. සීගිරිය 3. පොලොන්නරුව 4. මාගම නගරය

12. සීගිරි ජල උද්‍යානයේ ඇති කාණු පද්ධතිය දහරකාරව නිර්මාණය කිරීමට හේතුව වන්නේ මින් කුමක්ද?

1. වර්ෂාකාලයේදී රොන්මඩ හසාගෙන යාමට. 2. ජලය ටික දුරක් සෙමින් ගමන් කිරීමට
3. රොන්මඩ ගුරුත්ව බලයෙන් පහලට කිදා බැසීමට 4. එකතුවන රොන්මඩ ඉවත් කිරීමට

13. විදේශ රටවලින් භාණ්ඩ ආනයනය කිරීමේදී වරායවල් වලදී එකළ රේගු බදු අයකර තිබූ බවට දැක්වෙන ශාක්ෂි හමුවන්නේ මින් කුමන ප්‍රදෙශයෙන්ද?

1. අම්බලන්තොට ගොඩවායෙන් 2. සිතුල්පව්ව විහාරයෙන්
3. සල්වතොට කැණීමෙන් 4. ගෝකණ්නතිත්ත කැණීමෙන්

14. පුරාවිද්‍යාඥයන් හස්ඵබු කාසි, කහවණු, කහාපන යන නම්වලින් හඳුන් වන්නේ මින් කුමන කාසි වර්ගයක්ද?

1. රිදී කාසි විශේෂයක් 2. රන් කාසි විශේෂයක්
3. තඹ කාසි විශේෂයක් 4. තඹ මිශ්‍ර රිදී කාසි විශේෂයක්



CamScanner

15. පැරණි ශ්‍රී ලංකාවේ කාන්තාවන් ප්‍රාදේශීය පාලන කටයුතුවල නියැලී සිටි බව සනාථ කිරීමට සාක්ෂි සපයන සෙල්ලිපිය මින් කුමක්ද?

1. කොක්ඇබෙ ඇති සෙල්ලිපියේ
2. දඹුල්ලේ ඇති සෙල්ලිපියේ
3. තෝනිගල සෙල්ලිපියේ
4. බ්‍රාහ්මණයාගම ඇති සෙල්ලිපියේ

- පහත සඳහන් තොරතුරු ඇසුරින් 16 සිට 18 තෙක් ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - කොත්මලේ සඟවා තිබූ දන්ත ධාතුව බෙලිගල තැන්පත් කිරීම.
B - කාලිංගරායර, වෝඩගංහ යන දකුණු ඉන්දියානුවන් ආක්‍රමණය කිරීම.
C - ජෝතිය සිටුගේ කරැල්ල මැඩ පැවැත්වීම.
D - ඉන්දියාවේ පාණ්ඩය අධිරාජ්‍යයෙන් සහය ලැබීම.
E - ඊජිප්තුව සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම.
F - උලකුඩය දේවියගේ පුත් ජයබාහු රජකමට පත්වීම.

16. ඉහත තොරතුරු ඇසුරින් දඹදෙණි රාජධානියේ සිදු වූ සිදුවීම් පමණක් දැක්වෙන පිළිතුර මින් තෝරන්න.

1. A හා C
2. B හා E
3. A හා D
4. C හා F

17. කෝට්ටේ යුගයේ පමණක් සිදු වූ සිදුවීම් ඇතුලත් පිළිතුර වන්නේ,

1. B හා D
2. C හා F
3. B හා D
4. A හා E

18. යාපහුව රාජධානි සමයේ සිදුවීම් දැක්වෙන පිළිතුර මින් තෝරන්න.

1. A හා D
2. C හා E
3. B හා E
4. D හා F

19. දෙවන රාජසිංහ රජු උඩරට රාජධානියෙහි පාලනය කළ කාලය තුල උඩරටට අයත් නොවූ වරායක් වන්නේ මින් කුමක්ද?

1. කල්පිටිය
2. මඩකළපුව
3. ගාල්ල
4. හලාවත

20. මහනුවර රාජධානි සමයෙහි කෘෂිකාර්මික අර්ථ ක්‍රමයක් පැවතිබව දැක්වෙන වඩාත් වැදගත් තොරතුර මින තෝරන්න.

1. අතිරේක ආහාර බෝග මගින් ආහාර අවශ්‍යතා සපුරා ගැනීම.
2. ඒ ඒ කුලවලට වෙන් වූ ආර්ථික රටාවක් තිබීම.
3. පන්, ලාක්ෂා වැනි කර්මාන්ත ව්‍යාප්තව පැවතීම.
4. පන්සල ගැමි දිවිය හා බැඳුණු මධ්‍යස්ථානයක් වීම.

21. මහනුවර රාජධානි සමයෙහි රටවසම හෙවත් ප්‍රදේශ පාලනය කිරීමේදී කෝරළයේ එක් එක් කුල භාරව පුද්ගලයා මින් කවුරුන්ද?

1. මුහන්දිරම්
2. දිසාවේවරු
3. විදානේවරු
4. රටේ රාල

22. පුනරුදය ඉතාලියෙන් ආරම්භවීමට බලපෑ ප්‍රධාන හේතුව මින් කුමක්ද?

1. ජාතික රජයවල රජවරුන් කලාත්මක අටුතුවලට අනුග්‍රහය දැක්වීම.
2. ධනවතුන් කලාත්මක කටුතුවලට අනුග්‍රහය දැක්වීම.
3. කොන්ස්තන්තිනෝපලය තුරකින් යටත් කර ගැනීම.
4. සාහිත්‍යයේ කැපී පෙනෙන වෙනසක් සිදුවීම.

23. පුනරුදයේ බලපෑම නිසා ලංකාවේ ආර්ථිකයෙහි ඇතිකළ වෙනස්කමක් දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

1. ආහර ද්‍රව්‍ය වැඩි වශයෙන් අපනයනය කිරීම.
2. යුරෝපා රටවල් සමඟ වෙළඳ සබඳතා බිඳ
3. ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම.
4. පෘතුගීසීන් වතු වගාවට යොමුවීම.



CamScanner

24. පුනරුද යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය මින් කුමක්ද?

1. වටකුරු ආරුක්කුවලින් සමන්විතවීම.
2. උස් කුළුණු දක්නට ලැබීම.
3. උස් වහලවල් දක්නට ලැබීම.
4. අර්ධගෝලාකාර ශිකර දක්නට ලැබීම.

25. අවස්ථා කිහිපයකදී උඩරට සෙනරත් රජුට යාපනයේ මුහුදු සීමාව හාරහා දකුණු ඉන්දියව සමඟ වෙළෙඳ සබඳතා පැවැත්වීමට උදව්කළ යාපනයේ පාලකයා මින් කවුරුන්ද?

1. සංකිලි රජු
2. එදිරිමාන්නසිංහම් රජු
3. පරරාජසේකරම් රජු
4, පුවිරාජපණ්ඩාරම් රජු

26. 1602 වර්ෂයේ දී පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි දූතයා වන්නේ මින් කවුරුන්ද?

1. ෆන් එංගල් බෙක්
2. බැරන් වැන් එක්
3. පෙරනිමෝද අසවේදු
4. ජොරිස් වැන් ස්පිල්බර්ජන්

27. කාර්මිකරණයේ ප්‍රධාන සමාජ ප්‍රතිඵලයක් වන්නේ මින් කුමක්ද?

1. පන්ති සහිත සමාජයක් බිහිවීම
2. ධනපති පන්තියක් බිහිවීම
3. රාජාණ්ඩු ක්‍රමය බිඳ වැටීම
4. වංශාධිපතිවරුන් බිහිවීම

28. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාවට බලපෑමෙන්, දුම්රිය මාර්ග ඉදිකිරීමේ කටයුතු සිදු කිරීමට මුලිකත්වයගත් ආණ්ඩුකාරවරයා මින් කවුරුන්ද?

1. එඩ්වන්ඩ් බාන්ස්
2. ෆෙඩ්රික් නොර්ත්
3. තෝමස් මේටලන්ඩ්
4. හෙන්රි වේඩ්

29. 1848 වර්ෂයේ ඇතිවූ දෙවන නිදහස් අරගලයේදී රජ්‍ය හා මහජනතාව අතර සබඳතාව දුරස්වීම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය මින් තෝරන්න.

1. සිවිල් සේවකයන්ට වතු වගාව සඳහා අවසර ලබා දීම.
2. නිලධාරින්ගේ බල ප්‍රදේශ විශාල වූ නිසා අධීක්ෂණ කටයුතු අපහසු වීම.
3. රජයේ නව බදු ප්‍රතිපත්ති හඳුන්වා දීම.
4. සිවිල් සේවක තනතුරු අඩු කිරීමට කටයුතු කිරීම.

| වර්ෂය | පුද්ගලයා | සිදුවීම |
|---|---|---|
| A - 1872 | D - සිද්ධි ලේඛබේ මහතා | G - පානදුරාවාදය සිදිවීම |
| B - 1882 | E - ආරුමුග නවලාර්තුමා | H - යාපනයේ ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම |
| C - 1873 | F- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි | I - මුස්ලිම් නෙයිසන් පුවත්පත ආරම්භ කිරීම |

30. ඉහත සඳහන් තොරතුරු ඇසුරින් හින්දු ආගමික පුනරුදය හා සම්බන්ධ සිදුවීම් ඇතුලත් පිළිතුර වන්නේ,

1. A, F හා G
2. A, E හා H
3. C, D හා I
4. B, E හා H

31. ඉස්ලාම් ආගමික පුනරුදය හා සම්බන්ධ සිදුවීම් ඇතුලත් පිළිතුර මින් තෝරන්න.

1. B, D හා H
2,. C, D හා H
3. B, D හා I
4. A, E හා G

32. බෞද්ධ ආගමික පුනරුදය හා සම්බන්ධ සිදුවීම් ඇතුළත් පිළිතුර මින් කුමක්ද?

1. A, D හා H
2. C, D හා G
3. B, D හා G
4. C, F හා G

33. ව්‍යවස්ථා සභාවේ මුල්වරට නිල නොලත් බහුතරයක් දක්නට ලැබෙන්නේ මින් කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ද?

1. මැණිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල
2. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල
3. කෘව් මැකලම් ප්‍රතිසංස්කරණවල
4. මැණිං ඩෙවෝන්ෂයර් ප්‍රතිසංස්කරණවල



CamScanner

34. කෝල්බෘක් මෙරටට පැමිණෙනවිට සෘජු බදු වශයෙන් අය කළ බදු වර්ගයක් නොවන්නේ මින් කුමක්ද?

1. මාළු බද්ද 2. ඉඩම බද්ද 3. මත්පැන් බද්ද 4. තුවක්කු බද්දමාර්

- පහත A , B, C හා D වලින් දැක්වෙන ප්‍රකාශ යුගල අධ්‍යනය කර 35 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - 1. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. ජාතික රාජ්‍ය සභාව

B - 1. ගොවිජනපද පිහිටුවීම
2. රටේ ආහාර නිෂ්පාදනය වැඩිවීම

C – 1. සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
2. සමානුපාතික නියෝජනය

D – 1. පාර්ලිමේන්තුව
2. මුදල් පරිපාලන

35. ඉහත සඳහන් කරුණු අතරින් දෙවැන්න ස්ථාපිත කිරීමට පලමුවැන්න බලපෑ පද යුගලය වන්නේ,

1. C 2. A 3. B 4. D

36. පළමුවැන්න සතු බලතලයක් දෙවැන්නෙහි සඳහන් පද යුගලය මින් තෝරන්න.

1. A 2. C 3. B 4. D

37. පලමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් නොමැති පද යුගලය වන්නේ,

1. B 2. C 3. A 4. D

38. පළමුවැන්න ආරම්භ වීමේ අරමුණක් දෙවැන්නේ සඳහන් පද යුගලය වන්නේ,

1. C 2. B 3. A 4. D

39. රුසියාවේ පැවති ඔක්තෝබර් විප්ලවයෙන් පසු ඇති වූ ප්‍රධාන ප්‍රතිඵලය වුයේ මින් කුමක්ද?

1. වෛමාර් සමූහ ආණ්ඩුව බලය අල්ලා ගැනීම
2. මෙන්ශේවික්වරු බලයට පත්වීම
3. බෝල්ස්හෙවික්වරු රජයක් පිහිටුවීම
4. සාර් රජවරු බලයෙන් ඉවත් කිරීම

40. පළමුවන ලෝක යුධ සමයේ ඉතාලියේ සිටි අගමැතිවරයා මින් කවුරුන්ද?

1. විටෝරියෝ ඕලැන්ඩෝ
2. වුඩ්රෝ විල්සන්
3. ලෝයිඩ් ජෝර්ජ්
4. ක්ලේමෙන්ෂෝ



CamScanner

# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

## පෙරහුරු පරීක්ෂණය - 2025

| 11 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය : පැය 03 යි. |
|---|---|---|


03581

- 1 කොටසේ ප්‍රශ්න අංක 01 අනිවාර්යවේ.
- 11 කොටසින් ප්‍රශ්න හතරකට ද, 111 කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.
- අමතර කියවීම් කාලය විනාඩි 10 කි.

### 1 කොටස

01. (අ) පහත 1 යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලංකා සිතියමේ ද 11 යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.

1. කාලතිත්ත, සීතාවක, කුරුණෑගල, ගල්සොහොන්කනත්ත, කන්කසන්තුරේ, පුනරින්, පදවිය වැව, මාදුරුඔය ජලාශය, මැණික් ගඟ, හෝර්ටන්තැන්න, කටුවන කොටුව, අලිගල. (ල. 12)

11. ඉස්තාම්බුල්, බෝල්ටික් මුහුදු, මලය අර්ධද්වීපය, තායිවානය, කයිරෝ නගරය, ස්පාඤ්ඤය. (ල. 6)

(ආ) 1. පහත A ,B, C, D යටතේ දක්වා ඇති තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් අනුපිළිවෙලින් දක්වන්න.

A. කඳවුරු සිරිත නම් ග්‍රන්ථය රචනා කිරීමට පාදක් වූ රජතුමා කවුරුන්ද?


B. 1505 වර්ෂයේ පෘතුගාල රජු විසින් පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත් කර එවන්නේ කවුරුන්ද?

C. මෙරට ප්‍රථම විධායක ජනාධිපති ලෙස පත්වූයේ කවුරුන්ද?

D. දෙවන ලෝක යුද සමයේ බ්‍රිතාන්‍යයේ සිටි අගමැති කවුරුන්ද? (ල 4)

(ඇ) පහත A හා B රූප සටහන් අධ්‍යනය කොට පිළිවෙලින් පිළිතුරු සපයන්න.

A




01. 1 . A රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක්ද?

2. එය නිර්මාණය කර ඇති උපකරණය නම් කරන්න.

3. මෙය හමු වූ ස්ථානය නම් කරන්න.

4. මෙය කුමන යුගයේ නිර්මාණය කර තිබේද? (ල.4)

B



02. 1 . B රූපයෙන් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?

2. ඔහු ගොඩනැගූ රට කුමක්ද?

3. ඔහු යුරෝපයේ යුද්ධයක පැටලෙන්නේ කුමන රටක් සමඟද?

4. මොහු හා සම්බන්ධ ලෝක යුද්ධය කුමක්ද? (ල.4)



CamScanner

02. 1. ප්‍රාග් ඓතිහාසික මානවයා ක්ෂුද්‍ර ශිලා මෙවලම් භාවිතා කරමින් සිදුකළ කාර්යයන් තුනක් නම් කරන්න. (ල. 3)

11. (a) පූර්ව ඓතිහාසික යුගයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සපයාගත් ආකාර දෙකක් සඳහන් කරන්න.

(b) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් නම් කරන්න (ල.4)

111. පූර්ව ඓතිහාසික යුගයේ ජීවත් වූ මානවයාගේ ජීවන රටාව කෙබඳු දැයි කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ල. 5)

1V. මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල සංවිධානය හා පරිපාලනය ක්‍රමවත්ව තිබූ බව දැක්වෙන සාක්ෂි තුනක් සඳහන් කර විස්තර කරන්න. (ල. 6)

03. 1. පළමුවන විජයබාහු රජතුමා ඉන්දියාව සමඟ පැවැත්වූ සබඳතා තුනක් සඳහන් කරන්න. (ල.3)

11. (a) පැරණි ශ්‍රී ලංකාවේ පැවති විදේශීය භික්ෂුණ් වහන්සේලා පවා අධ්‍යාපනය ලැබූ ප්‍රධාන අධ්‍යාපන මධ්‍යස්ථාන දෙකක් නම් කරන්න.

(b) අතීතයේ මෙරට පැවති පැරණි වෙළඳ නගර දෙකක් නම් කරන්න. (ල. 4)

111. ශ්‍රී ලංකාවේ පැරණි සමාජය තිරසාර ලෙස පත්වාගෙනයාමට විවිධ වෘත්තීන් මැදිහත්ව කටයුතු කර ඇත. එවැනි වෘත්තීන් දෙකක් දක්වා ඔවුන්ගේ කාර්ය භාරය කෙටියෙන් විස්තර කරන්න,(ල. 5)

1V. අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති බුදුදහම හා වෙනත් ආගම් ව්‍යාප්තවීම පිළිබඳ කරුණු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

04. 1. අතීතයේ ශ්‍රී ලංකාව පාලනය කළ රැජිණියන් තිදෙනෙකු නම් කරන්න. (ල. 3)

11. පැරණි ශ්‍රී ලංකාවෙන් හමුවූ විදේශීය කාසි වර්ග හතරක් නම් කරන්න. (ල.4)

111. පැරණි රජවරුන් පරිසරය රැකගැනීමට පනවා තිබූ නීති දෙකක් සඳහන් කර එය වර්තමාන සමාජයට වැදගත්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

1V. ඓතිහාසික යුගයේ සමාජය සංවිධානය වී තිබූ ආකාරය කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න. (ල. 6)

05. 1. පැරණි නගර පරිහාණියට හේතු තුනක් සඳහන් කරන්න. (ල.3)

11. පහත සඳහන් රාජධානිවල ආරම්භක රජවරුන් කවුරුන්දැයි පිළිවෙළින් සඳහන් කරන්න.

A - යාපහුව B - කෝට්ටේ

C - දඹදෙණිය D - කුරුණෑගල (ල.4)

111. පොලොන්නරු රාජධානිය බිඳවැටීමට හේතු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

1V. කෝට්ටේ යුගය "සාහිත්‍යයේ ස්වර්ණමය යුගය" ලෙස හැඳින්වීමට හේතු වූ කරුණු තුනක් විස්තර කරන්න. (ල. 6)



CamScanner

06. 1. ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසින්ගේ අවධානය යොමුවීමට බලපෑ කරුණු තුනක් සඳහන් කරන්න. (ල. 3)

11. මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් සඳහන් කරන්න. (ල. 4)

111. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් කර ගැනීමේදී දැකිය හැකි කැපී පෙනෙන අවස්ථා දෙකක් සඳහන් කර කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

1V. 1848 වර්ෂයේ නිදහස් අරගලයට බලපෑ කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

07. 1. මෙතෙක් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණයෙන් තේරී පත් වූ ජනාධිපතිණියක් හා ජනාධිපතිවරණයකින් තේරී පත් නොවූ ජනාධිපතිවරුන් දෙදෙනකු නම් කරන්න. (ල.3)

11. (a) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ පැවති ව්‍යවස්ථාදායක කටයුතු සඳහා පිහිට වූ ද්විමණ්ඩල නම් කරන්න.

(b) සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව අගමැතිවරයාට තිබූ බලතල දෙකක් සඳහන් කරන්න. (ල. 4)

111. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ඡන්ද විමසීම් ක්‍රම දෙකක් දක්වා විස්තර කරන්න. (ල. 5)

1V. නිදහසින් පසු ආරම්භ කල මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයේ දක්නට ලැබුණු මූලික අරමුණු තුනක් විස්තර කරන්න. (ල. 6)

## 111 කොටස

08. 1. පුනරුදයේ කලා ශිල්පවල දැකියහැකි ලක්ෂණ තුනක් නම් කරන්න. (ල. 3)

11. පුනරුද යුගයේ භාෂාව හා සාහිත්‍ය කෙරෙහි අවධානය යොමු කළ ඉතාලියේ හා එංගලන්තයේ ගත් කතුවරයන් දෙදෙනකු බැගින් සඳහන් කරන්න. (ල. 4)

111. පුනරුද සමයේ සිදු වූ ආර්ථික නවෝදය කරුණු දෙකක් මඟින් විස්තර කරන්න . (ල. 5)

1V. පුනරුදය නිසා ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ල. 6)

09. 1. දෙවන ලෝක සංග්‍රාම කාලය තුල පහත සඳහන් රටවල සිටි නායකයින් කවුරුන්දැයි පිළිවෙලින් සඳහන් කරන්න.

A - ඇමරිකා එක්සත් ජනපදය B - ජර්මනිය C - බ්‍රිතාන්‍යය (ල. 3)

II. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් හතරක් සඳහන කරන්න. (ල 4)

111. පළමුවන ලෝක යුධ සමයේ ජර්මනිය පරාජය වීමට බලපෑ කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

1V. එක්සත් ජාතීන්ගේ සංගමය පිහිටුවීමේ අරමුණු තුනක් සඳහන් කර එම අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාමාර්ග උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 6



CamScanner

eduhelp

CamScanner

ஆபிரிக்கா
Africa
இந்திய சமுத்திரம்
Indian Ocean
Z

**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**11 ශ්‍රේණිය - ඉතිහාසය - පිළිතුරු**

**සාධන පරීක්ෂණය (2025/26)**

## 1 කොටස

01. ඇරිස්ටෝටල්
02. අශ්වහිස සහ මිනිසා
03. ගින්නට හසුවීම නිසා මැනවින් පිලිස්සී තිබීම
04. පූර්ව ඓතිහාසික යුගය ලෙස
05. විශ්වාසය
06. පරුමකවරු
07. දෙවන සේන රජු කාලයෙහි
08. CBA
09. CDAB
10. A,C හා D ය
11. සිගිරිය
12. රොන්මඩ ගුරුත්ව බලයෙන් පහලට කිදා බැසීමට
13. අම්බලන්තොට ගොඩවායෙන්
14. රිදී කාසි විශේෂයක්
15. බ්‍රහ්මනයාගම ඇති සෙල්ලිපියේ
16. A හා D
17. C හා F
18. B හා E
19. ගාල්ල
20. අතිරේක ආහාර බෝග මගින් ආහාර අවශ්‍යතා සපුරා ගැනීම
21. මුහන්දිරම්
22. ධනවතුන් කලාත්මක කටයුතුවලට අනුග්‍රහය දැක්වීම
23. ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම
24. උස් වහලවල් දක්නට ලැබීම
25. එදිරිමාන්නසිංහම් රජු
26. ජොරිස් වැන් ස්පිල්බර්ජන්
27. පන්ති සහිත සමාජයක් බිහිවීම
28. හෙන්රි වෝඩ්
29. රජයේ නව බදු ප්‍රතිපත්ති හඳුන්වාදීම
30. A, E හා H
31. B, D හා I
32. C, F හා G
33. මැණිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
34. තුවක්කු බද්ද
35. A
36. D
37. C
38. B

39. බෝල්ශේවික්වරු රජයක් පිහිටුවීම
40. විටෝරියෝ ඕලැන්ඩෝ

11 ප්‍රශ්න පත්‍රය - 1 කොටස

01. (ආ) 1. A – 11 පරාක්‍රමබාහු රජතුමා
B - ෆ්‍රැන්සිස්කූ ද අල්මේදා
C - ජේ. ආර්. ජයවර්ධන මහතා
D - වින්ස්ටන් චර්චිල්

(ඇ) 1. 1. පින්තාරු කළ මැටි බඳුන

2. සකපෝරුව

3. උඩරංචාමඩම පැරණි නිවාසය

4. පූර්ව ඓතිහාසික යුගයේ

2. 1. ඔටෝවොන් බිස්මාර්ක්

2. ජර්මනිය

3. ප්‍රංශය

4. පළමු ලෝක යුද්ධය

11 කොටස

02. 1. සතුන් දඩයම් කිරීම, සිරීම්, කැපීම්, හැරීම්,තැලීම්
11. (a) වර්ෂා ජලය හා කුඩා ගංගාවල ජලය
(b) වාර්ෂික වර්ෂාපතනයෙ අගය, පසේ ස්වභාවය, භූ විෂමතාවය, ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය,ජලවහනය, භූ හෙතික පසුබිම.

111. - ස්ථිරවාසිතාවය
- පිලිස්සූ මැටි වළං භාවිතය
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධියක් ආරම්භ කිරීම.
- යකඩ ලෝහය භාවිතය
- කෘෂිකර්මාන්තය ආරම්භ කිරීම
.....
.....

1V, - ගමක පවුල් කිහිපයකින් සැදුම් ලත් ඒකකයක්
- ගම පාලනය සඳහා ගමික කටයුතු කිරීම.
- ගම් කිහිපයකින් සැදුම් ලත් ප්‍රදේශ තිබීම.
- .....

03. 1. කාලිංග වංශික තිලෝකසුන්දරී විවාහකර ගැනීම/ පාන්ඩය කුමරෙකුට තම සහෝදරිය විවාහ කර දීම. දළදාවේ ආරක්ෂාවට වෙල්යික්කාර හමුදාව ගෙන්වා ගැනීම/වෙළඳාම

11. (a) අභයගිරිය/ මහාවිහාරය/ජේතවනය

(b) කදුරුගොඩ/ මාගම/ දේවනාගර/ බහස නගර/ අබ නගර .....

111. - ගුරුවරු

- ෛවද්‍ය වෘත්තීය

- නීති විශාරදයින්

- විවිධ ශිල්පින්

.....

1V. - මිහිඳු මහරහතන් වහන්සේගේ වැඩමවීම හා බුදුදහමට තදානුබද්ද පුදපූජා ව්‍යාප්ත වීම.

- භික්ෂූන්ට වාසය කිරීමට ගල්ගුහා පූජ කිරීම.
- පන්නසාලා යන ගොඩනැගිලි විශේෂයක් ගැන සඳහන් වීම.
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.
- කථින උත්සව පැවැත්වීම.
- වෙනත් ආගම් - බ්‍රාහ්මණ ජන කණ්ඩායම් සිටීම.
- ශිව දෙවියන් වන්දනාමාන කර ඇතිබව
- හින්දු දේවස්ථාන ඉදිවීම
- අනුරාධපුරයෙන් හමුවන නෙස්ටෝරියානුවන්ට අයත් කුරුසයක් හමුවීම.
- ඉස්ලාම් ආගමට අයත් අදහස් ශ්‍රී ලංකාවේ පැවතීම.
-

04. 1. ලීලාවති/ අනුලාදෙවි / සුගලා දෙවි .....

11. රෝම/ පර්සියන්/ චීන/ ඉන්දියන් ....

111. උස් ගොඩබිම් ඉඩම්වල කැලෑ නොකැපිය යුතුයි. - හතරවන මිහිඳු රජු./අනුරාධපුර පුවරු ලිපිය කැලෑවල ගස්කොලන් නොකැපිය යුතුයි/ තුන්වන උදය රජතුමා/ බුද්ධන්නේහෙල සෙල්ලිපිය ගස්කොලන් කලමනාකරනයේදී රජය විසින් පනවා තිබෙන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීම/ පස්වන කාශ්‍යප රජතුමා/ කොන්ඩවට්ටවාන් ටැම් ලිපිය

.....

1v. - තිරස් හා සිරස් ධුරාවලියක් දක්නට ලැබීම.
- රජු බෝසත් ගුණයෙන් යුක්තවීම.
- රාජකීය නිලධාරීන් හා මහා සංඝරත්නය රජයට අනුශාසනා කරමින් ඉහළ ස්ථානයක වැඩ සිටීම.
- සමාජයේ ප්‍රභූන් ලෙස කටයුතු කල පිරිස් සිටීම.
- සාමාන්‍ය ජනතාව මගින් සමාජය නඩත්තුවීම.
- .....

05. 1. සතුරු ආක්‍රමණ/ මධ්‍යගත පාලනය බිඳ වැටීම/ ආරක්ෂාව නැතිවීම/ වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපනවීම/ ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණයවීම.

11. A - පළමුවන භුවනෙකබාහු රජු B - හයවන පරාක්‍රමබාහු රජු
C - තුන්වන විජයබාහු රජු D - දෙවන භුවනෙකබාහු රජු

111. දුර්වල පාලකයන් බලයට පත්වීම/ කාලිංග හා පාණ්ඩය වංශිකයන් අතර බල අරගල/ ආර්ථික පරිහානිය/ කාලිංග මාඝගේ ආක්‍රමණය.

1V. - හයවන පැරකුම්බා රජු සාහිත්‍ය දියුණුවට කටයුතු කිරීම.
- උගත් පඬිවරුන් බිහිවීම
- විවිධ පැතිවලට යොමු වූ ග්‍රන්ථ රචනාවිම
- අධ්‍යාපන මධ්‍යස්ථාන බිහිවීම
- උගත් පඬිවරු බිහිවිම.
-

06. 1. බෙංගාල බොක්කට මුහුණලා පිහිටා තිබීම/ ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැක ගැනීමට/ ඊසාන දිග මෝසම් සුළං කාලයේ නැව් ආරක්ෂා කර ගැනීමට

11. බදු එකතු කිරීමට දේශීය නිලධාරීන් පත් කිරීම/ පොල් ගස් බද්ද ඇතුළු අලුත් බදු වර්ග ඉවත් කිරීම/ ආදායම් එකතු කිරීමට හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම/ ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම.

111. - ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම පාලනය කිරීම
- මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍ය කිරීටයේ යටත් විජිතයක් බවට පත්වීම
- උඩරට රාජ්‍ය ඉංග්‍රීසින් යටත් කර ගැනීම.

1V. - රජයේ ඉඩම් ප්‍රතිපත්තිය
- ගම් සභාව අඩපනවීම.
- නව අධිකරන ක්‍රමය

07. 1. ජනාධිපතිනිය - චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය
ජනාධිපතිවරන්යකින් පත්නොවූ ජනාධිපතිවරුන් - ඩී.බී. විජේතුංග හා රනිල් වික්‍රමසිංහ මහතා

11. (a) මහජන මන්ත්‍රී මණ්ඩලය (නියෝජිත මන්ත්‍රී මණ්ඩලය )/ සෙනෙට් සභාව (උත්තර මන්ත්‍රී මණ්ඩලය )

111. ජනාධිපතිව රණය/ සමානුපාතික නියෝජන ක්‍රමය/ ජනමත විචාරණය.

1V. - වියලි කලාපයේ ගොවිබිම්වලට නිත්‍ය ජල පහසුකම් සැපයීම.
- විදුලිබලය නිෂ්පාදනය කිරීම.
- ඉඩම් නැති යට ඉඩම් ලබා දී ආහාර භෝග වගාව ව්‍යාප්ත කිරීම.

111 කොටස

08. 1 කලාකරුවන් ස්වාධීනව තම දක්ෂතා ඉස්මතුකර නිර්මාණ බිහි කිරීම/ ලෞකික රස වින්දනය අගය කරන ධනවතුන් බිහිවීම/ ගත්කතුවරුන්ගේ නමින් නිර්මාණ බිහිවීම/ ආගමික සිතුවිලවලට මුල්තැන දීම/ ලෞකික රසවින්දනයට මුල්තැන දීම.

11. ඉතාලිය - ඩාන්ටේ/ පෙට්‍රාක්/ බොකාෂියෝ
එංගලන්තය - සර් තෝමස් මුවර්/ ප්‍රන්සිස් බේකන්/ විලියම් ෂෙක්ස්පියර්

111. - ස්වයංපෝෂිත අර්ථක්‍රමය බිඳ වැටීම.
- වෙළෙදාමේ දියුණුවක් ඇතිවීම.
- ජාතික වෙළෙඳ ප්‍රතිපත්ති, ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම
- මුදල් භාවිතය
- .....

1V. - සාම්ප්‍රදායික රාජාණ්ඩුක්‍රමය බිඳ වැටීම.
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.
- පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබීම.
- ප්‍රාදේශීය පාලනය වෙනස්වීම.
- සාම්ප්‍රදායික නිලධාරී පන්තිය අභාවයට යාම.

09. 1. A - ෆ්‍රැන්ක්ලින් රුස්වෙල්ට් B - ඇඩෝල්ෆ් හිට්ලර් C - වින්ස්ටන් චර්චිල්

11. ඇමරිකා එක්සත් ජනපදය/ සෝවියට් සංගමය/ එක්සත් රාජධානිය/ ප්‍රංශය/ චීනය

111. - ඇමරිකාව යුද්ධයට සම්බන්ධවීම්.
- හිට්ලර් සියදිවි නසා ගැනීම.

- රුසියාව ආක්‍රමණය කිරීමේදී ජර්මනිය පරාජයවීම.
- මිත්‍ර සේනා ජර්මනියට කඩා වැදීම.
- .....

1V. - ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වාගෙන යාම.
- ජාතීන් අතර මිත්‍ර සබඳතා වර්ධනය කිරීම.
- මානව අයිතිවාසිකම් හා මූලික නිදහස තහවුරු කිරීමෙහිලා ජාත්‍යන්තර සහයෝගය සාක්ෂාත් කර ගැනීම.

අවසන් සංශෝධන ඇතුලත් කරගන්න